**පොලිස් මාධ්‍ය කොට්ඨාසය**
**பொலிஸ் ஊடகப் பிரிவு**
**POLICE MEDIA DIVISION**
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2025.04.03 පැය 0920 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/630 / 2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |

## මුදල් වංචාවකට සම්බන්ධ සැකකරුවෙකු හා සැකකාරියන් දෙදෙනෙකු අත්අඩංගුවට - අපරාධ පරීක්ෂණ දෙපාතර්මේන්තුව.

ශ්‍රී ලංකා ආයුවෙර්ද ඖෂධ සංස්ථාවේ පරිගණක මෘදුකාංග පද්ධතියේ දත්ත වෙනස් කරමින් චෙක් පත් මඟින් රුපියල් 27,031,024.15 ක මුදලක් වංචා කළ බවට පරණ කොට්ටාව පාර, නාවින්න, මහරගම ලිපිනයේ පිහිටි ශ්‍රී ලකා ආයුවෙර්ද ඖෂධ සංස්ථාවේ සාමාන්‍යාධිකාරිවරයා විසින් 2025.03.20 වන දින අපරාධ පරීක්ෂණ දෙපාතර්මේන්තුව වෙත සිදු කරන ලද පැමිණිල්ලකට අදාලව විමශර්න ආරම්භ කර තිබුණි.

එම විමශර්නයට අනුව මුදල් වංචා කරන ලද සැකකරු හා ඊට ආධාර අනුබල දුන් සැකකාරියන් දෙදෙනෙකු 2025.04.01 වන දින අපරාධ පරීක්ෂණ දෙපාතර්මේන්තුවේ නිලධාරින් විසින් අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 35 ක් වන කැලණිය ප්‍රදේශයේ හා සැකකාරියන් අවුරුදු 25, 32 යන වයස් වල පසුවන කැලණිය ප්‍රදේශවල පදිංචිකරුවන් වේ.**

සැකකරු හා සැකකාරියන් දෙදෙනා 2025.04.02 වන දින නුගේගොඩ ගරු මහේස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කිරීමෙන් පසු 2025.04.11 වන දින දක්වා රක්ෂිත බන්ධනාගාර ගතකර ඇත. අපරාධ පරීක්ෂණ දෙපාතර්මේන්තුව වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**